# බස්නාහිර පළාතේ පළාත් සභා රැස්වීම

## 2014 දෙසැම්බර් මස 01 වන සඳුදා

### බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බැකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණයේ සභා ශාලාවේදී පවත්වන ලද රැස්වීම

පූ.භා.09.08 ට සභාව රැස් විය. ගරු සභාපතිතුමා මූලාසනාරූඪ විය.

- **පැමිණීම :**

| | |
|---|---|
| ගරු සුනිල් විජේරත්න | (සභාපතිතුමා) |
| ගරු යසපාල කෝරළගේ | (නියෝජ්‍ය සභාපතිතුමා) |
| ගරු ප්‍රසන්න රණතුංග | (බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල් ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකි රක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති හා වෙළඳ අමාත්‍යතුමා සහ බස්නාහිර පළාතේ කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත, පරිසර ක ටයුතු සහ සංස්කෘතික හා කලා කටයුතු පිළිබඳ වැඩ බලන අමාත්‍යතුමා) |
| ගරු උපාලි කොඩිකාර | (බස්නාහිර පළාතේ විදුලිබල හා බලශක්ති, පළාත් මාර්ග, නිවාස හා ඉදි කිරීම්, ජල සම්පාදන හා ජලාපවාහන, සමාජ සුභසාධන සහ නාගරික හා වතු යටිතල පහසුකම් අමාත්‍යතුමා) |
| ගරු නිමල් ලාන්සා | (බස්නාහිර පළාතේ ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, කාන්තා කටයුතු, ආහාර සැපයීම හා බෙදා හැරීම, සමූපකාර සංවර්ධන, ගෘහ ආර්ථික ප්‍රවර්ධන, ධීවර, ග්‍රාම සංවර්ධන, සංචාරක, ආයෝජන ප්‍රවර්ධන සම්බන්ධීකරණ සහ සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු රංජිත් සෝමවංශ | (බස්නාහිර පළාතේ සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යතුමා) |
| ගරු ගාමිණී තිලකසිරි | (සභානායකතුමා) |
| ගරු මංජු ශ්‍රී අරංගල | (විපක්ෂ නායකතුමා) |
| ගරු සිසිර ජයකොඩි | (ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

අනුරාධ විමලරත්න
අනුරුද්ධ ලේකම්ගේ
අසෝක රන්වල
අශෝක දයාරත්න
අනන්ද හරිස්චන්ද්‍ර ද සිල්වා
අමල් සිල්වා
අර්ෂාඩ් නිසාම්ඩීන්
ඇන්ටනී උපුල් රාජිත
ඉන්දික බණ්ඩාර
ඉසුර දේවප්‍රිය
ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්
උදාර රත්නායක
උපාලි ගුණරත්න
උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ
එම්.එස්.එම්. රහීම්
එස්.එම්. මරික්කාර්
එස්.ඒ. සමන්මලී සකලසූරිය මෙනෙවිය
ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව
කවින්ද හේෂාන් ජයවර්ධන
කිත්සිරි කහටපිටිය
කීර්ති කාරියවසම්
කේ.ඩී. අරුණ දීපාල්
කොලන්නගේ වජිර පෙරේරා
චන්දන ජයකොඩි
ජගත් අංගගේ
ජගත් කුමාර
ජගත් පී. විතාන
ජනක දීපාල් වැලිවත්ත
ජයන්ත ද සිල්වා
නලින්ද ජයතිස්ස
නිමල් චන්ද්‍රරත්න
නිරෝෂ් ඩිල්ෂාන් ජයවර්ධන
නිරෝෂන් පාදුක්ක
නීල් සුනේත්‍රලාල් ප්‍රනාන්දු
පියල් නිශාන්ත
පී.ආර්.පී. අබේගුණවර්ධන
පී.ඩී.අබේරත්න
ප්‍රදීප් උඳුගොඩ
බී.පී. ලක්ෂ්මන් ගුණවර්ධන
මල්ෂා කුමාරණතුංග මැතිනිය
මහින්ද ජයසිංහ
මහේෂ් අල්මේදා
මංජුල බුද්ධදාස
මෙරිල් පෙරේරා
මොහොමඩ් මුජිබුර් රහුමාන්
මෙහොමඩ් ෆයිරුස්
මොහොමඩ් ෆායිස්
යූ.එල්.එන්.පී. උඩවෙල
යූ. ජෝර්ජ් පෙරේරා
රජිත හපුආරච්චිගේ
රවීන්ද්‍ර යසස් කුමානායක
රවී විජේසේකර
රොජර් සෙනෙවිරත්න
රොඩ්නි රුඩොල්ෆ් ෆ්‍රේසර්
රොයිස් විජිත
රෝස් ප්‍රනාන්දු මෙනෙවිය
ලක්ෂ්මන් නිපුණ ආරච්චි
ලයනල් ජයසිංහ
ලලන්ත ගුණසේකර
ලලිත් එල්ලාවල
ලලිත් වනිගරත්න
ලලිත් වර්ණකුමාර
ලෙනාඩ් කරුණාරත්න
විජිත් ප්‍රියන්ත
ශිරන්ත අමරසේකර
ශ්‍රීනාත් පෙරේරා
සන්ධ්‍යා සිරිවර්ධන මැතිනිය
සහන් ප්‍රදීප්
සෙනල් වෙල්ගම
සුනිල් ජයමිණී
සුනිල් වටගල
සුමිත්ලාල් මැන්දිස්
සුසාර දිනාල්
සුසිල් කිඳෙල්පිටිය
හෙක්ටර් බෙත්මගේ

**නොපැමිණීම :**

| | |
|---|---|
| ගරු හර්ෂණ සුපුන් රාජකරුණා | (විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

ආනන්ද රංජිත් රූපසිංහ
ඇ.ශ්‍රීනාත් ම. පෙරේරා
උදය ප්‍රභාත් ගම්මන්පිල
උද්දේන විජේරත්න
එඩ්වඩ් ගුණසේකර
එස්. කුහවරදන්
කේ.ඩී. ලාල්කාන්ත
කෝකිලා හර්ෂනී ගුණවර්ධන මැතිනිය
ගමගේ නිහාල් ප්‍රේමශාන්ත පෙරේරා
ගුණසිරි ජයනාත්
ඩී.ඩබ්ලිව්. පුෂ්පකුමාර ද සිල්වා
නව්සර් ෆවුසි
නිමල් ආර්. පීරිස්
නිරෝෂා අතුකෝරල මැතිනිය
නිශාන්ත ශ්‍රී වර්ණසිංහ
මනෝ ගනේෂන්
සලෝචන ගමගේ
සේනක දමයන්ත ද සිල්වා
හිරුණිකා එරාංජලී ප්‍රේමචන්ද්‍ර මෙනෙවිය

## 01. නිවේදන :

*i*

*" ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මැතිතුමා දැරූ බස්නාහිර පළාතේ කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත, පරිසර කටයුතු සහ සංස්කෘතික හා කලා කටයුතු පිළිබඳ අමාත්‍ය ධූරයෙන් ඉල්ලා අස්වන බව, එතුමා විසින් 2014.11.18 දිනැති ලිපිය මඟින් ගරු ආණ්ඩුකාරතුමා වෙත දන්වා ඇති බවත්, ගරු ආණ්ඩුකාරතුමා විසින් එම ඉල්ලා අස්වීම පිළිගත් බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී."* .

*ii*

*"අද දින සිට පුරා දින හතරක් තිස්සේ පැවැත්වෙන මුදල් ප්‍රකාශ පිළිබඳ විවාදය ඒ සෑම දිනකම පෙ.ව. 09.00 ට ආරම්භ වන බවත්, එම විවාදය පැවැත්වෙන කාලය තුළදී ගණ පූරණය පවත්වා ගැනීම පිළිබඳව සැලකිලිමත් වන මෙන් ගරු මන්ත්‍රීතුවරුන් වෙත ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී."*

## 02. කාරක සභා වාර්තා පිළිගැන්වීම :

ගරු සභාපතිතුමා විසින් පහත සඳහන් කාරක සභා වාර්තා පිළිගන්වන ලදී.

i. 2014.10.31 වන දින පැවති මහජන පෙත්සම් කාරක සභා රැස්වීම් වාර්තාව.
ii. 2014.11.19 වන දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව.

## 03. පළාත් සභාවේ රැස්වීම : [2015.01.20]

*"2014 දෙසැම්බර් මස 04 වන දිනට නියමිත වැඩ කටයුතු අවසන්ව විසිර යෑමෙන් අනතුරුව, මෙම සභාව 2015 ජනවාරි මස 06 වන දින පෙ.ව. 09.30 ට රැස් විය"* යුතු යැයි රංජිත් සෝමවංශ ගරු සභා කටයුතු අමාත්‍යතුමා යෝජනා කළද, ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් පළාත් සභාවේ රැස්වීම 2015 ජනවාරි 20 වන දින පෙ.ව. 09.30 ට රැස්වීම සුදුසු බව යෝජනා කරන ලදුව, සභාව ඊට එකඟ වූයෙන් ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

## 04. පළාත් සභාවේ කටයුතු :

රංජිත් සෝමවංශ ගරු සභා කටයුතු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*"2014 නොවැම්බර් මස 19 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභාවේදී එළැඹුණු එකඟතාවයට අනුව, 2014 දෙසැම්බර් මස 04 වන දින සභා රැස්වීමේ වැඩ කටයුතු සඳහා රීති අංක 50(5), 50(11) හි විධිවිධානයන්ගෙන් කිනම් හෝ බාධාවක් සිදු නොවිය යුතුය."*

## 05. වාර්ෂික මුදල් ප්‍රකාශය : 2015

ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් පහත සඳහන් යෝජනාව යළිත් සභාභිමුඛ කරන ලදී.

*"2015 වර්ෂය වෙනුවෙන් පිළියෙල කරන ලද මුදල් ප්‍රකාශය අනුමත කළ යුතුය."*

## 06. පොදු සාකච්ඡාව :

පූ.භා. 09.30 ට පොදු සාකච්ඡාව ආරම්භ විය.

*ගරු නිරෝෂන් පාදුක්ක*
*ගරු මහේෂ් අල්මේදා*
*ගරු කිත්සිරි කහටපිටිය*

***පූ.භා. 10.17 ට ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, සුමිත් ලාල් මෙන්ඩිස් ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.***

*ගරු ඉසුර දේවප්‍රිය*
*ගරු රෝස් ප්‍රනාන්දු*
*ගරු ජගත් කුමාර*
*ගරු මහින්ද ජයසිංහ*
*ගරු අශෝක දයාරත්න*
*ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ*
*ගරු සුසිල් කිඳෙල්පිටිය*
*ගරු සුසාර දිනාල්*

***අ.භා. 12.05 ට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා [සුමිත් ලාල් මෙන්ඩිස් මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.***

*ගරු අරුණ දීපාල්*
*ගරු ජගත් අංගගේ*
*ගරු රොඩ්නි ෆ්‍රේසර්*
*ගරු සහන් ප්‍රදීප් විතාන*

***අ.භා. 12.59 ට පළාත් සභාවේ ගණ පූර්ණය නොමැති බව රජිත හපුආරච්චිගේ ගරු මන්ත්‍රීතුමා විසින් පෙන්වා දෙන ලදින්, කැඳවීමේ සීනුව නාද කරන ලදුව, පසුව ගණ පූරණය ඇති විය.***

*ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි*

***අ.භා. 01.14 ට පළාත් සභාව දිවා විවේකය සඳහා තාවකාලිකව අත්සිටුවන ලදින්, අ.භා. 02.22 ට ගරු සභාපතිතුමාගේ [සුනිල් විජේරත්න මහතා] ප්‍රධානත්වයෙන් යළිත් රැස් විය.***

*ගරු ලලිත් එල්ලාවල*
*ගරු එස්.එම්. මරික්කාර්*
*ගරු ජනක වැලිවත්ත*

***එවලේ එනම්, අ.භා. 02.59 ට එස්.එම්. මරික්කාර් ගරු මන්ත්‍රීතුමා විසින් සභාවේ ගණ පූරණය පිළිබඳ ප්‍රශ්නය නගන ලදුව, එවලේ සභාවේ ගණ පූර්ණය නොමැති බව පෙනී ගියෙන් කැඳවීම් සීනුව නාද කිරීමට නියෝග කරන ලදී.***

***පසුව ගණපූරණය ඇති නොවූයෙන්, ගරු සභාපතිතුමා විසින් රැස්වීම තාවකාලිකව අත්සිටු වන ලදුව, අ.භා. 03.30 යළිත් රැස් විය.***

## 07. 12(1) රීති යටතේ කල් තැබීම :

එතෙක් සභාවේ ගණ පූරණය ඇති නොවූයෙන් ගරු සභාපතිතුමා විසින් 12 (1) රීතිය යටතේ පළාත් සභාව කල් තබන ලදී.

***ඊට අනුකූලව පළාත් සභාව, ප.ව. 03.32 ට, 2014 දෙසැම්බර් මස 02 වන දින පූ.භා. 09.00 වන තෙක් කල් ගියේය.***

හේමන්ත සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2014.12.01
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5 වන මහල, බී පර්යන්තය,
සෙත්සිරිපාය, බත්තරමුල්ල.

කුමා/01 Minuts 2014.12.01 - Hansard Section